# වාර්ෂික වාර්තාව - 2015

## උද්භිද උද්‍යාන භාර අරමුදල

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## පේරාදෙණිය

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා වු භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2015

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා වු භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

| | | |
|---|---|---|
| 1. අරමුදලේ නම | : | ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල |
| 2. ස්වභාවය | : | උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු, සුභ සාධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මුල්‍ය සහාය ලබාදීම |
| 3. අදාල චක්‍රලේඛයන් | : | I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව<br>II ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය හා 2006.12.22 දින නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/423 අනුව |
| 4. ආරම්භ කළ දිනය | : | 1996 දෙසැම්බර් 20 |
| 5. කාර්යාලය | : | පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය |
| 6. බැංකුව | : | පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848 |

## 7. අරමුදලේ පරමාර්ථ:

- ✓ ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියා මාර්ග ගැනිම.
- ✓ පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩසටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යමය ආධාර සැපයිම.
- ✓ ශාක එකතුව පිළිබඳව ද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.
- ✓ උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.
- ✓ විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදිකිරිමේ කටයුත්තක් භාර ගැනිම.
- ✓ අවශ්‍ය අවස්ථාවන්හිදී පුනරාවර්තන ප්‍රතිපාදන වල ඌණතාවයන් ඌණපුරණය කිරීම.

### 2015 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| 2015-01-01 දිනට බැර ශේෂය | = | රු. | 124,411,696.21 |
| **එකතු කළා:** | | | |
| 2015 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. | 109,624,910.00 |
| | | | -------------------- |
| එකතුව | | රු. | 234,036,606.21 |
| **අඩු කළා :** | | | |
| 2015 වර්ෂයේ වියදම් (හර කිරීම්) | = | රු. | 88,638,951.56 |
| | | | -------------------- |
| 2015.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය | = | **රු.** | **145,397,654.65** |

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමණි)

**අරමුදලේ ප්‍රධාන පරමාර්ථයක් වන ශ්‍රී ලංකාව තුල හා විදේශ රටවල් තුල ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තව දුරටත් ඉහල නැංවීම අරමුණු කරගෙන පහත සඳහන් කටයුතු අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2015 වර්ෂයේදී ඉටු කරන ලදී.**

- උද්භිද විද්‍යා පර්යේෂණ යටතේ දේශීය ශාක සංරක්ෂණය හා ශාක පිළිබඳ දත්ත එකතු කිරීම සඳහා ජාතික ශාකාගාරය විසින් ක්‍රමවත් වැඩ පිළිවලක් අරඹන ලදි. ඒ අනුව අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ශාක නිදර්ශක එකතුවක් ආරම්භ කර ඇත.



එකතු කල ශාකයක නිදර්ශකයක්

- උද්භිද උද්‍යාන වල සේවයේ නියුතු විද්‍යාඥයින්ගේ හා අනෙකුත් තාක්ෂණ නිළධාරීන්ගේ ශ්‍රී ලංකාවේ මල් පිළිබඳ දැනුම අවබෝධය වර්ධනය කිරීම සඳහා මෙම වසරේ රාජකීය උද්භිද උද්‍යානයට ශ්‍රී ලංකාවේ මල් පිළිබඳව විස්තර ඇතුලත් අත් පොතක් වන " Illustrated Field Guide to the Flowers of Sri Lanka" පොත් කාණ්ඩ දෙකක් මිලදී ගෙන ඇත.




මිලදී ගත් පොත් දෙක

- අරමුදලේ ප්‍රතිපාදන සලසා ගනිමින් අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානය විසින් දේශීය මල්වගා කරුවන් සඳහා උද්‍යාන අලංකරණය,මල් වගාව,රුක් රෝපණය හා පැලෑටි හඳුනාගැනීම

පිළිබඳ පුහුණු පන්ති පවත්වන අතර මෙම පුහුණු කිරීම් තෝරාගත් උද්‍යාන නිළධාරීන් හා සේවකයින් සඳහාද පැවැත්වේ.

- උද්භිද උද්‍යානය පිළිබඳව උනන්දුවක් දක්වන අයගේ සහ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ජාතික ශාකාගාරය විසින් ශ්‍රී ලංකාවේ ඉහල කඳුකරයේ පාසි ශාක පිළිබඳ කල පර්යේෂණයන්හි දත්ත ඇතුලත් පාසි ශාක පිළිබඳව අලුතින් මුද්‍රණය කල "MOSS FLORA IN CENTRAL HIGHLANDS OF SRI LANKA" පොත අලෙවියට උද්භිද උද්‍යානවල අලෙවිසැල් වලට නිකුත් කර ඇත.




" MOSS FLORA IN CENTRAL HGHLANDS OF SRI LANKA"

- මිට අමතරව ශ්‍රී ලංකාවේ වන මල් පිළිබඳව විස්තර ඇතුලත් " Beautiful Wild Flowers Of Sri Lanka" පොත මුද්‍රණය කිරිම සඳහා බාර දී ඇත. එය 2016 වර්ෂයේදී අලෙවිය සඳහා අලෙවි සැල් වෙත නිකුත් කිරිමට නියමිතය.

- 2015.04.26 සිට 2015.05.01 දින දක්වා පැවති 09 වැනි උද්භිද උද්‍යාන සංරක්ෂණය පිළිබඳ අන්තර් ජාතික සමුළුවට සහභාගි වීමෙන් ලද දැනුම උපයෝගි කරගෙන ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වල විද්‍යාඥයින්ගේ දැනුම වර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

- සේවාස්ථ වැඩමුළු පැවැත්වීමෙන් නිළධාරි සහ සේවක දැනුම වර්ධනය කිරිමට පියවර ගෙන ඇත.

- උද්භිද උද්‍යාන තුල නරඹන්නන්ට පහසුකම් සැලසීම යටතේ උද්‍යාන තුල නරඹන්නන්ට ගමන් පහසුකම් සලසනු වස් බැටරි කාර් ආසන 08 කාර් 05 ක් සහ ආසන 04 කාර් 05 ක් මිලදී ගන්නා ලදී. බැටරි කාර් යෙදවීම තුලින් අරමුදලේ අමතර ආදායම් උපයීමද වර්ධනාත්මක ලෙසින් වැඩි වී ඇත. ඒ අනුව 2015 වර්ෂයේ බැටරි කාර් ආදායමින් රු.මි 9.00 ක් අරමුදල උපයා ඇත.මෙම කාර් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල උද්භිද උද්‍යානය, ගම්පහ උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල උද්භිද උද්‍යානය සහ හම්බන්තොට උද්භිද උද්‍යාන වල නරඹන්නන්ගේ පහසුව සඳහා ධාවනයට යොදා ඇත.




මිලදී ගත් බැටරි කාර් රථයක් හක්ගල උද්භිද උද්‍යානයේ නරඹන්නන් සමග





- මෙම වර්ෂයේ උද්භිද උද්‍යානයේ නරඹන්නන්ගේ ආකර්ෂණය ලබා ගැනීම පිණිස ඉතාමත් දැකුම්කලු ලෙස උද්‍යාන නඩත්තු කිරීම භාර අරමුදලින් ප්‍රතිපාදන සලසමින් ඉතා ආකර්ෂණීය මට්ටමකින් වර්ෂය තුල පවත්වාගෙන යන ලදී. ඒ අනුව නව ප්‍රභේද සහිත මල් පැළ සහ බීජ මිලදී ගෙන මල් ගොමු සහ පාත්ති අලංකාර ලෙස වැඩි දියුණු කරන ලදි.

**<u>පේරාදෙණිය උද්භිද උද්‍යානයේ අලංකාරය පිණිස සකස් කල මල් ගොමු වල දර්ශන කිහිපයක්</u>**







## හක්ගල උද්භිද උද්‍යානය වසන්ත සමය සඳහා සකස් කල මල් ගොමු වල දර්ශන කිහිපයක්









ගම්පහ උද්භිද උද්‍යානයේ අලංකාරය පිණිස සකස් කල මල් ගොමුවක දර්ශනයක්





අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ රෝස උයනේ දර්ශනයක්



## අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2015 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

### පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

- මෙම වර්ෂයේ පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නව තාක්ෂණය යොදා ගනිමින් නවීන ආකාරයේ පැල ගෘහයක් මිලියන 15 ක වියදමින් ඉදි කිරීම 2015 වර්ෂයේ අවසාන කාර්තුවේ ආරම්භ කරන ලදි.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඉදිකරන පැල ගෘහය

- නරඹන්නන්ගේ සිත් ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇතිව අලුතින් පොකුණක් මි.1.7 ක වියදමින් ඉදිකරන ලදි. ඒ අනුව උද්‍යානයේ අලුත් වත්ත කොටස නරඹන්නන්ගේ සිත් ඇදගන්නා ලෙස දර්ශනීය ලෙස සකස් කිරීමට කටයුතු කරන ලදි.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අලුතින් ඉදිකරන ලද පොකුණ

- රාජකීය උද්භිද උද්‍යානයේ අතුරු පාරවල් මි.2.1 වියදමින් සංවර්ධනය කරන ලදි. ඒ අනුව නරඹන්නන්ට පහසුවෙන් සහ ආරක්ෂිතව පයින් ගමන් කිරීමට පහසුකම් සලසන ලදි.

- පේරාදෙණිය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයිනගේ පහසුකම් සැලසීම යටතේ ආහාර ගැනීමට ඉදිකර තිබු ශාලා දෙක මි1.9 ක වියදමින් වැඩි දියුණු කරන ලදි.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නවීකරණය කරන ලද ආහාර ගැනීමේ ශාලා

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් සැලසීම යටතේ මි1.9 ක වියදමින් වැසිකිළි පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ නවීකරණය කරන ලද වැසිකිළි ගොඩනැගිල්ල

- නරඹන්නන්ට උද්‍යානයට ඇතුලු වීමට හා පිටවීමට පහසුකම් සැලසීම යටතේ ගන්නොරුව කොටසින් හෙල්ලෙන පාලම මතින් උද්‍යානයට ඇතුලු වීමට හා පිටවීමට හැකිවන ලෙස උද්‍යානයට ප්‍රවේශ වීම සඳහා පහසුකම් සලසන ලදි. ඒ අනුව හෙල්ලෙන පාලම මතින් උද්‍යානයට ඇතුලු වීමේදී නරඹන්නන්ට ආස්වාදජනක අත්දැකීමක් ලබා ගැනීමට හැකිවනු ඇත. මේ සඳහා මිලියන 1.4 ක් වැය කරන ලදි.



පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගන්නොරුව ප්‍රවේශ පත්‍ර කවුළුව

## හක්ගල උද්භිද උද්‍යානය

- හක්ගල උද්භිද උද්‍යානයේ පහත සඳහන් සංවර්ධන වැඩ අරමුදලේ ප්‍රතිපාදන සලසා ගනිමින් ඉටු කර ඇත.
- හක්ගල උද්භිද උද්‍යානය තුලට පිවිසෙන දැනට පිහිටි ප්‍රධාන දොරටුව නරඹන්නන් බොහෝ පිරිසක් පැමිණෙන අවස්ථා වලදී තද බදයට ලක්වන බැවින් උද්‍යානය තුලට නරඹන්නන් ප්‍රවේශ කිරීම සඳහා නව පිවිසුම් ගොඩනැගිල්ලක් සහිත ප්‍රවේශ දොරටුවක් ඉදිකිරිම ආරම්භ කරන ලදි. මේ සඳහා අනුමත දල ඇස්තමේන්තුව රු. මි. 12 කි.



හක්ගල උද්භිද උද්‍යානයේ ඉදිකරමින් පවතින නව පිවිසුම් ගොඩනැගිල්ල

- හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු සඳහා දැනට සිටින නිලධාරීන්ට,සේවකයින්ට කාර්යාල කටයුතු ඉටුකර ගැනීම සඳහා දැනට ඇති කුඩා කාර්යාලය ප්‍රමාණවත් නොවන බැවින් එම තිබෙන කාර්යාල ගොඩනැගිල්ල දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස වැඩිදියුණු කිරීමට ආරම්භ කල අතර, මේ සඳහා වන අනුමත දළ ඇස්තමේන්තු මුදල රු. මි. 6.7 කි.



හක්ගල උද්භිද උද්‍යානයේ ඉදිකරමින් පවතින කාර්යාල ගොඩනැගිල්ලේ දර්ශනය

- හක්ගල උද්භිද උද්‍යානය දුෂ්කර ප්‍රදේශයක පිහිටි බැවින් නිලධාරීන් සඳහා නේවාසික පහසුකම් සැපයිය යුතුව ඇත. ඒ අනුව කාර්ය මණ්ඩල නිල නිවාස දෙකක් රු. මිලියන 6.6 ක වියදමින් ( දළ ඇස්තමේන්තුව) ඉදිකිරීමට කටයුතු කරන ලදි.



හක්ගල උද්භිද උද්‍යානයේ ඉදිකරමින් පවතින කාර්ය මණ්ඩල නිල නිවාසය

## ගම්පහ උද්භිද උද්‍යානය

- නරඹන්නන් හට උඩවැඩියා මල් වගාව පිළිබඳව දැනුම අවබෝධය ලබා දීම අරමුණු කරගෙන එම කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස උඩවැඩියා පැල ගෘහයක් රු.මිලියන 21.3 ක වියදමින් ඉදිකිරීමට ආරම්භ කර ඇති අතර, මෙම ඉදිකිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටු කරමින් පවතී.



ගම්පහ උද්භිද උද්‍යානයේ ඉදිකරමින් පවතින උඩවැඩියා පැල ගෘහයේ දර්ශනය

## අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

- අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය නරඹන්නන් සඳහා විවෘත කිරීමට ප්‍රථම පිවිසුමේ දොරටුවේ වැට සහ ගේට්ටුව ඉදි කල යුතු බව නිරීක්ෂණය වු අතර, ඒ අනුව බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉදිකිරීම. 2014 වර්ෂයේ අවසාන කාර්තුවේ අරඹන ලදි. එහි වැඩ 2015 වර්ෂයේ අවසන් කරන ලදි. මේ සඳහා අරමුදලින් රු.මි 11 ක වියදමක් දරා ඇත.

- අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ රථවාහන ගාල් කිරීම සඳහා රථ වාහන නැවතුම්පලක් 2014 වර්ෂයේ අවසාන කාර්තුවේ බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරිපත් කල සැලසුමට හා ඇස්තමේන්තුවට අනුව ඉදිකිරීම් ආරම්භ කල අතර, එය 2015 වර්ෂයේදී අවසාන කරන ලදි. ඒ සඳහා රු. මිලියන 27 ක මුදලක් අරමුදලින් වියදම් කරන ලදි.

- අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය 2015 මාර්තු මස 25 වැනි දින මහජනතාවට විවෘත කරන ලදි.



අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපිය උද්භිද උද්‍යානයේ ඉදිකිරීම් අවසන් කල වැට සහ පිවිසුම් දොරටුව (ගේට්ටුව)




අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ඉදිකිරීම් අවසන් කල රථවාහන නැවතුම්පල



අවිස්සාවේල්ල සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ වැව සහ අවට දර්ශනයක්

## අරමුදල යටතේ 2015 වර්ෂය තුල ඉටු කරන ලද
## විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| | කාර්යය | ඇස්තමේන්තුව (රු.) | 2015 -12-31 දිනට මුළු වියදම (රු.) | ඉතිරි මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | භාරකාර මණ්ඩල පරිපාලන කටයුතු සඳහා වියදම | 400,000.00 | 373,087.80 | 26,912.20 |
| 2 | උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරිමේ වියදම | 35,570,000.00 | 33,216,787.18 | 2,353,212.82 |
| 3 | පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 33,350,000.00 | 27,186,014.82 | 6,163,985.18 |
| 4 | හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 8,830,000.00 | 6,762,272.46 | 2,067,727.54 |
| 5 | ගම්පහ උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 5,500,000.00 | 5,111,444.32 | 388,555.68 |
| 6 | ජාතික ශාකාගාරයේ සංවර්ධන වියදම | 350,000.00 | 329,983.61 | 20,016.39 |
| 7 | අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ සංවර්ධන වියදම | 16,000,000.00 | 15,659,361.37 | 340,638.63 |
| එකතුව | | 100,000,000.00 | 88,638,951.56 | 11,361,048.44 |

ආර්.එම්.ඩී.බී.මීගස්මුල්ල
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ සභාපති සහ
ලේකම්,
තිරසර සංවර්ධනය සහ වනජීවී අමාත්‍යාංශය.

කේ.එන්. යාපා
උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ
ලේකම්, සහ
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.